# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2024 අගෝස්තු 15 |


## ශ්‍රී ලංකා මහ බැංකුව 2024 අගෝස්තු මුදල් ප්‍රතිපත්ති වාර්තාව ප්‍රකාශයට පත් කරයි

2023 අංක 16 දරන මහ බැංකු පනතෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුව 2024 වසර සඳහා සිය දෙවැනි මුදල් ප්‍රතිපත්ති වාර්තාව නිකුත් කළේය. මෙම වාර්තාවේ අන්තර්ගතය, 2024 ජූලි මාසයේ මුදල් ප්‍රතිපත්ති සමාලෝචනයට අදාළ තීරණ ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් සැලකිල්ලට ගනු ලැබූ තොරතුරු මත පදනම් වී ඇත.

මුදල් ප්‍රතිපත්ති වාර්තාව, විශේෂයෙන් ම, ආර්ථික වර්ධනය සහ උද්ධමනයට අදාළව ඉදිරි දැක්මක් ලබා දෙයි. දේශීය සහ ගෝලීය වශයෙන් දැනට පවතින මෙන්ම අපේක්ෂිත ප්‍රවණතා සැලකිල්ලට ගනිමින්, උද්ධමන සහ ආර්ථික වර්ධන පුරෝකථන සඳහා පවතින අවදානම් පිළිබඳව ඇගයීමක් ඉදිරිපත් කිරීමද මෙම වාර්තාවෙන් අපේක්ෂා කරයි. මෙම වාර්තාව මගින් මැත කාලීන මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා මූලික වූ පසුබිම සන්නිවේදනය කිරීම තුළින් මහ බැංකුවේ විනිවිදභාවය සහ වගවීම වැඩි දියුණු කිරීමට මහ බැංකුව ප්‍රයත්න දරයි.

**විශේෂිත කරුණු:**

- අඩු උද්ධමන පීඩන හා අනුකූලව 2024 වසරේ මේ දක්වා ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.
- 2024 වසරේ මුල් භාගයේදී සිදු වූ තාවකාලික ඉහළ යාමෙන් අනතුරුව, බලශක්ති මිල ගණන් අඩු වීම, ආහාර උද්ධමනය මන්දගාමී වීම සහ ඉල්ලුම් අංශයේ පසුබෑම හේතුවෙන් මතුපිට උද්ධමනය සැලකිය යුතු ලෙස අඩු විය.
- නුදුරු කාලයේදී මතුපිට උද්ධමනය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 5ක ඉලක්කගත මට්ටමට වඩා පහළින් පවතිනු ඇතැයිද, මැදි කාලීනව ඉලක්කගත මට්ටම ආසන්නයේ ක්‍රමයෙන් ස්ථාවර වනු ඇතැයිද අපේක්ෂා කෙරේ.
- සාර්ව ආර්ථික ස්ථායීතාව ක්‍රමයෙන් යළි තහවුරුවීම, අඩු පොලී අනුපාතික සහ ආයෝජකයින්ගේ විශ්වාසය වැඩිදියුණු වීම හේතුවෙන් 2024 වසරේදී ආර්ථික ක්‍රියාකාරකම් අඛණ්ඩව යථා තත්ත්වයට පත් විය.
- 2024 වසරේදී ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධන ප්‍රවණතාව අඛණ්ඩව පවතිනු ඇතැයිද, මැදි කාලීනව එහි උපරිම ධාරිතාවය කරා ක්‍රමයෙන් ගමන් කරනු ඇතැයිද අපේක්ෂා කෙරේ.

*මාර්ගගත ප්‍රකාශනයක් වන මුදල් ප්‍රතිපත්ති වාර්තාව මහ බැංකු නිල වෙබ් අඩවියේ පහත සබැඳියෙන් ලබා ගත හැකිය.*
*මුදල් ප්‍රතිපත්ති වාර්තාව | Central Bank of Sri Lanka (cbsl.gov.lk)*

# මුදල් ප්‍රතිපත්ති වාර්තාව සංක්ෂිප්තය

**2024 අගෝස්තු**

## මුදල් ප්‍රතිපත්ති රාමුව


ආර්ථික වර්ධනය එහි උපරිම ධාරිතාවයට ළඟා වීමට සහාය දක්වමින් උද්ධමනය සියයට

**5%**

ඉලක්කගත මට්ටටමේ පවත්වාගෙන යාම අරමුණු කරගෙන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලබයි.



## මෑතකාලීන මුදල් ප්‍රතිපත්ති තීරණ






ශ්‍රී ලංකා මහ බැංකුව 2023 මැද භාගයේ දී ආරම්භ කළ ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව පවත්වාගෙන යනු ලබයි.

## ඉදිරි දැක්ම

### මතුපිට උද්ධමනය

ඉදිරි මාසවලදී ඉලක්කගත මට්ටමට වඩා අඩු වනු ඇති බවද, සුදුසු ප්‍රතිපත්ති සමඟ මැදි කාලයේදී 5%ක ඉලක්කය කරා ළඟා වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.



### ආර්ථික වර්ධනය

සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සමඟ මැදි කාලීනව ආර්ථික වර්ධනය එහි උපරිම ධාරිතාවය දක්වා අඛණ්ඩව යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.